## කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනය - 2014

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කළයුතු වුවත් ආයතනය විසින් දැනට භුක්ති විඳින කොළඹ විශ්වවිද්‍යාලය විසින් 1983 නොවැම්බර් 14 දිනැති ලිපිය මඟින් පවරා දෙන ලද පර්චස් 27.86 ක් වූ ඉඩම ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.2,961,340 ක් වූ මෝටර්රථ තවදුරටත් ආයතනය ප්‍රයෝජනයට ගනිමින් පැවතුන ද එහි සාධාරණ අගය පෙන්නුම් කෙරෙන පරිදි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂය සඳහා රජයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.7,276,370 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැයකර තිබුණි.

**2.2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයතනය විසින් ආරම්භ කර තිබුණු රක්ෂණාවරණ යෝජනා ක්‍රමය සඳහා සංවර්ධන අරමුදලින් රු.1,000,000 ක අරමුදලක් මාරු කර තිබූ අතර ශාස්ත්‍රීය කමිටු නියෝග අනුව පාඨමාලා ආදායමින් සියයට 1 ක් වූ රු.4,188,040 ක මුදලක් මෙම අරමුදලට බැර කර ඇතත් මේ සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

වැඩ තහනම් කර ඇති ආචාර්යවරයෙකුගෙන් රු.191,000 ක ආපදා ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රිති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 | භාණ්ඩාගාර අරමුදලින් ලබාදුන් හඳුනානොගත් රු.220,479 ක අත්තිකාරම් නොපියවා තිබුණි. |
| (ආ) | 2004 ජුලි 29 දිනැති අංක පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එකතුව රු. 22,537,408 ක අරමුදල් ආයෝජනය කර තිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 1979 නොවැම්බර් 13 දිනැති අංක 49 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,340,232 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,174,118 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.3,833,886 කින් අඩුවීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන රු.7,403,000 කින් අඩු වීම සහ සේවක වැටුප් රු.1,689,688 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

ආයතනය විසින් අඛණ්ඩව මාස 15 ක් තිස්සේ රු.20,000,000 ක මුදලක් නිවේදනීය තැන්පතු වල ආයෝජනය කර තිබූ අතර එම මුදල ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීමේ කටයුත්තක හෝ වෙනත් ප්‍රතිලාභ ලබා දෙන ආයෝජන මාර්ගයක යෙදවීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

**4.2 අරමුදල් ඌන උපයෝජනය**

ආයතනය සතු බැංකු ගිණුම් 05 කට අදාලව එකතුව රු. 37,648,113ක සාමාන්‍ය මාසික මුදල් ශේෂයක් ඌන උපයෝජිතව පැවතුණි.

**4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

ආයතනයේ පවතින ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා 2014 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු රු.12,000,000ක මූලධන ප්‍රතිපාදනය 2015 ජූලි 30 දින දක්වා අදාල කාර්යය සඳහා භාවිතයට ගෙන නොතිබූ අතර 2013 සහ ඊට පෙර ලැබී තිබුණු මූලධන ප්‍රතිපාදන රු.3,668,896ක් ද ඌන උපයෝජිතව පැවතුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට වැය නොකල ප්‍රතිපාදන රු. 15,668,896ක් විය.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ගිණුම්කරණය
(ඇ) මූල්‍ය කළමනාකරණය